පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව සබරගමුව - සති පාසල

විෂය - නාට්‍ය හා රංගකලාව

පළමු වාරය - ජනවාරි - 4 වන සතිය

09 ශ්‍රේණිය

සැකසුම - චතුරිකා ප්‍රියදර්ශනී.
ර/නිවි/කහවත්ත මධ්‍ය මහා

Department of Education, Sabaragamuwa Province/ Weekly School

<u>තොරතුරු පත්‍රිකාව</u>

# සමාරෝපය හඳුනාගනිමු.

තමාගේ ස්වරූපය අතහැර දමා නළුවකු හෝ නිළියක යම් චරිතයකට ආරූඪ වී වෙනත් කෙනෙකුගේ ස්වරූපය ගැනීම, වෙස්වලා ගැනීම, ආවේශවීම "සමාරෝපයයි."

මෙසේ නළුවකු හෝ නිළියක විසින් තමා නිරූපණය කරන චරිතය ආත්මගත කර ගැනීම තුළින් චරිතයත් තමනුත් අතර ඇති දුරස්ථ බව නැති කර තමාට සමීපස්ථභවක් ඇති කර ගැනීමේ කුසලතාවය ඇති වේ. එසේම විශිෂ්ට රංගනයක් මඟින් විශ්වාසනීය ව ප්‍රේක්ෂකයා ඇද බැද තබා ගනිමින් වඩා විශ්වාසනීය ව නළු කාර්යයක යෙදී නාට්‍ය පිටපතේ අන්තර්ගතයට සාධාරණයක් ඉටු කර ගැනීමටද සමාරෝපය ඉතා වැදගත් ව



සමාරෝපයේ ප්‍රධාන වශයෙන් කොටස් 02කි.

1. **බාහිර සමාරෝපය.**
2. **අභ්‍යන්තර සමාරෝපය.**

- ## බාහිර සමාරෝපය

බාහිර සමාරෝපය නැවත ප්‍රධාන කොටස් 03 ක් ඔස්සේ හඳුනාගත හැකි ය.

- පුද්ගල සමාරෝපය - චරිතයකට ප්‍රවිශ්ට වීම.
- ස්ථානීය සමාරෝපය - චරිතය ගැවසෙන ස්ථානය අනුව ප්‍රවිශ්ට වීම.
- ද්‍රව්‍යමය සමාරෝපය - චරිතයට අදාළ උපකරණ ගෙන ප්‍රවිශ්ට වීම.

බාහිර සමාරෝපය යනු චරිතයට අවශ්‍ය ආකාරයෙන් වේශ නිරූපණය කොට රංග වස්ත්‍රවලින් සැරසීමයි. නාට්‍යයක චරිත හඳුනා ගැනීම සඳහා ඇඳුම් පැළඳුම් හා ඔවුනොවුන් භාවිතා කරන උපකරණ උපකාරී වේ. මඟතොටේ දී දිනපතා අපට මුණගැසෙන පිරිස් විවිධ වෘත්තීන්වල නිරතවන්නන් බව හඳුනා ගැනීමට ඔවුන් ඇඳ පැළඳගත් දෑ මෙන් ම අතේ ගෙන යන උපකරණ ද ආධාර වේ.



උදා:- හෙදිය, වෛද්‍යවරයා, ගුරුවරයා, පොලිස් නිලධාරියා, පාසැල් සිසුන් ආදී චරිත වෙන්

වෙන් වශයෙන් හඳුනා ගැනීමට ඔවුන්ගේ ඇඳුම පැළඳුම හේතු වේ. චරිතයක වයස, ජාතිය,

සමාජ තරාතිරම චරිත අභ්‍යන්තරය වැනි කරුණු වේෂ භූෂණය මඟින් ප්‍රේක්ෂකයාට

හඳුනා ගත හැකි අතර මෙම තත්ත්වය අංගරචනය මඟින් වඩාත් තහවුරු වේ.

## ▪ අභ්‍යන්තර සමාරෝපය



අභ්‍යන්තර සමාරෝපය යනු යම් චරිතයකට අදාළ ආකාරයෙන් කටහඬ, හැසිරවීම, චරිතයට අදාළ ලෙස මුහුණේ ඉරියව් මඟින් භාව ප්‍රකාශනය ශරීරාංග හැසිරීම සිදු කරයි. නළුවාට බාහිර සමාරෝපයට අවශ්‍ය සියලු දෑ පිටපත් සපයා දුන්නද නළුවාට සිය රංගනය සාර්ථකව සිදු කිරීමට නම් සතත අභයාසය මඟින් නළුවා විසින්ම අභ්‍යන්තර සමාරෝපය තමා විසින් ම පුරුදු පුහුණු කළ යුතු ය. මේ සඳහා අවශ්‍ය රංග අභ්‍යාස, ශරීරාංග අභ්‍යාස, චිත්ත ඒකාග්‍රතාවය ඇති කර ගැනීම, චරිත පිළිබඳ ලියා ඇති ග්‍රන්ථ පරිශීලනය, අත්දැකීම් ලැබීම, සමාජයේ ජීවත් වන එවැනි චරිත අධ්‍යාපනය, කටහඬ, ශරීරික අභ්‍යාසයන්හි නිරතවීම ආදී විවිධ උපක්‍රම භාවිතා කිරීම මඟින් චරිතයක ඇති විවිධ භූමිකාවලට ක්ෂණික ව ප්‍රවේශ වීමට, සංවාද මතක තබා ගැනීමට නියමිත හඬ භාවිතා කර උච්චාරණය කිරීම, අදාළ චලනවල නිරත වීම, මුහුණේ හැඟීම් චරිතයට අවශ්‍ය ලෙස ක්ෂණිකව වෙනස් කර ගැනීමට ආදී බොහෝ ප්‍රයෝජන නළුවාට ලබා ගත හැකි වේ.



සාර්ථක රංගනයක් සඳහා මේ දෙයාකාරයේ ම සමාරෝපය වැදගත් වේ. එය නාට්‍යය මඟින් කාලයට දේශයට, සංස්කෘතියට මෙන් ම මනෝභාවයන්ට ද අනුකූල විය යුතු ය. සමාරෝපය මඟින් නාට්‍යයේ අන්තර්ගතය ප්‍රේක්ෂකයාට විනිවිද දැකිය හැකි බැවින් සමාරෝපණය යනු නාට්‍යයක දී අතිශයින්ම වැදගත් අංගයක් බව පැහැදිලි වේ.

**<u>පැවරුම</u>**

1. සමාරෝපය යන්න හඳුන්වන්න.
2. සමාරෝපය බෙදෙන කොටස් ගණන කීයද?
3. සමාරෝපය බෙදෙන කොටස් දෙක කෙටියෙන් හඳුන්වන්න.